# බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

# හම්බන්තොට දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන උපරිම තොරතුරු හා පැහැදිළි කිරීම් අනුව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාවට අයත් නව කාර්යාල පුස්තකාල සායන ගොඩනැගිල්ලේ කඩ කාමර බඳුදීමෙන් ලැබිය යුතු එක්වන් මුදල් (Key money) අදාල ලේඛනය අනුව රු. 9,641,665 ක් වුවද , ගිණුමට ගෙන තිබුණේ රු. 8,308,792 කි. ඒ අනුව රු. 1,332,873 ක මුදලක් අඩුවෙන් දැක්වුණි.

(ආ ) 2012 දෙසැම්බර් මාසය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ගේ විශ්‍රාම වැටුප් බිල්පත අනුව , 2012 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සඳහා රු. 4,554,484 ක මුදලක් ගෙවිය යුතුව තිබුණද එකී මුදල ණය හිමියන් යටතේ පෙන්වා නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.95,162,115 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,066,382 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,719,321 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 2,602 | 2,882 | 553 |
| (ii) | බදුකුලී | 9,898 | 10,092 | 1,620 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 399 | 399 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,141 | 23,181 | 12,126 |

#### 2.2.2 වරිපනම් බදු

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු මුදල රු. 542,770 ක් වූ අතර මෙම වරිපනම් බදු ශේෂය තුළ කාර්තු 11 සිට 43 ක් දක්වා අය නොවන හිඟ වරිපනම් ශේෂ ඇති බව නිරීක්ෂණය

විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර මෙම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 අක්කර බදු

2012 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ අක්කර බදු රු. 10,625 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

2.2.4 කඩකාමර බදු

කඩකාමර 07 කින් සමාලෝචිත වර්ෂයට අයවිය යුතු රු. 2,261,673 ක එක්වන් මුදල අයවී නොතිබුණි.

2.2.5 යන්ත්‍රෝපකරණ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ යන්ත්‍රෝපකරණ ආදායම රු. 3,993,059 ක් විය. මෙම මුදලින් රු. 1,082,189 ක් 2011 හා ඊට පෙර වර්ෂ වලට අදාල විය.

2.3 අවිධිමත් ගණුදෙනු

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 අනුව රු.500,000 ට වැඩි වටිනාකමට වූ භාණ්ඩ මිළට ගැනීම හා සේවා ලබා ගැනීම් වලදී අවම වශයෙන් මිළ ගණන් 05 ක් වත් ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද , ඊට පටහැනිව අවස්ථා දෙකකදී රු. 1,373,182 ක උපකරණ මිළට ගැනීම් හා සේවා ලබා ගැනිම් සිදුකර තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2012 දෙසැම්බර් 31 දිනට රු. 1,356,923 ක් වූ කල් පසු වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය